# කැලණිය විශ්වවිද්‍යාලය -ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

## වාණිජවිද්‍යාවේදී (විශේෂ) උපාධි ප්‍රථම වර්ෂ පරීක්ෂණය (බාහිර) 2009

## 2010 ඔක්තෝබර්/නොවැම්බර්

**BCOM E 1015 – කළමනාකරණ මූලධර්ම**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්ණ පහකට (05) පිළිතුරු සපයන්න.

01. අ. කළමනාකරණය ක්‍රියාවලියක් ලෙස හඳුන්වන්නේ කුමක් නිසාද ?

(ලකුණු 05)

ආ. නූතන කළමනාකරණයේ සංකීර්ණභාවය වැඩි වීමට හේතු වී ඇති කරුණු විස්තර කරන්න.

(ලකුණු 07)

ඇ. " අතීතයේ සිටි කළමනාකරුවන්ට වඩා විශාල සමාජ වගකීමක් නූතන කළමනාකරුවන්ට පැවරී ඇත. " සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. අ. " සියළුම කළමනාකරුවන් මානව සම්බන්ධතා සඳහා විශේෂ අවධානයක් යොමු කළ යුතුය." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද ? හේතු දක්වන්න.

(ලකුණු 06)

ආ. විවිධ කළමනාකරණ භූමිකා නිදසුන් දෙමින් පැහැදිලි කරනන.

(ලකුණු 07)

ඇ. සංවිධානමය පරිසරය මඟින් ව්‍යාපාරයකට ඇති වන බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

03. අ. " සංවිධානයක වඩාත් වැදගත්ම කළමනාකරණ ශ්‍රිතය සැලසුම්කරණය වේ ". ඔබ එකඟ වන්නේද ? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. සැලසුම්කරණ ක්‍රියාවලියේදී " ශදුඅත " (SWOT) විශ්ලේෂණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පියවරයන් නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04. අ. " සියළුම කළමනාකරුවෝ නායකයෝය." මෙම ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 05)

ආ. නායකයෙකුට බලය ලැබෙන මූලාශ්‍ර මොනවාද ?

(ලකුණු 05)

ඇ. නායකත්වය පිළිබඳ ගති ලක්‍ෂණ න්‍යාය, චර්යාත්මක න්‍යාය සමග සන්සන්දනය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. අ. සේවකයින් අභිප්‍රේරණය කිරීමෙහිලා අවශ්‍යතා ධූරාවලි න්‍යායට හිමි වැදගත්කම කුමක්ද ?

(ලකුණු 05)

ආ. හර්ස්බර්ග්ගේ ද්විත්ව සාධක න්‍යාය, මැස්ලෝගේ අවශ්‍යතා ධූරාවලි න්‍යායෙන් වෙනස් වන්නේ කෙසේද ?

(ලකුණු 05)

ඇ. " සේවක කාර්යය සාධනය කෙරෙහි බලපාන්නේ, අභිප්‍රේරණය පමණක් නොවේ. සේවකයාට තමාගේ කාර්යය කිරීමට හැකියාවක් පැවතිය යුතු අතර වැඩ කිරීමට සුදුසු වැඩ ව්‍යුහයක්ද පැවතිය යුතු වේ." ඔබ මෙම ප්‍රකාශය සමඟ කෙතරම් දුරට එකඟවන්නේද ?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. අ. විවිධ සන්නිවේදන ක්‍රම වල ඇති වාසි සහ අවාසි විස්තර කරන්න.

(ලකුණු 06)

ආ. ඵලදායි සන්නිවේදනයක් සඳහා ඇති බාධා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ. " පාලනය " වැදගත්වීමට හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

07. පහත සඳහන් දෑ පිළිබඳව කෙටි සටහන් ලියන්න.

අ. දෙපාර්තමේන්තුකරණය

ආ. පාලන විතතිය

ඇ. අදිශ නියමය

ඉ. විධාන දිමේ දාමය

ඊ. බලතල පැවරීම

(ලකුණු 4x5=20)

(මුළු ලකුණු 20)